PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 16-Iss. II, Dec. 2025, 110-128.
DOI: https://doi.org/10.4038/p.v16i2.76

පහළ කල්ලාරු නිම්නයේ පුරාවිද්‍යාත්මක ගවේෂණයෙන් හමු වූ ශිලා මෙවලම් පිළිබඳ මූලික අධ්‍යයනයක්

[A Preliminary observation on the stone artefacts from Lower Kallaru Valley]

Radawane Sirisumangala[1]
Alexsender Kapukotuwa[2]
Oshan Wedage[3]

ABSTRACT

The Kallaru Valley is emerging as an important region for testing current hypotheses concerning early human habitation of Sri Lanka. Archaeological investigations were conducted to identify prehistoric human activities in the open area known as Boralu Kanda in the lower Kallaru Valley in 2024. According to soil map, this region represents the Iranamadu formation, and human artefacts are prominently preserved in the gravel bed. The Kallaru assemblage features prepared core and Levallois technologies, the production of points (triangular, perforators and small bifaces) and various retouched tools mainly on local raw material sources (churt). Typologically, the assemblage exhibits reasonable affinity with Attirappakkam and Juwalapuram in Indian Industries. Given the potential Paleolithic record from the North West coastal area that can be compared with existing middle Stone Age datasets from the South Asia.

Keywords: Kallaru, Stonetool, Paleolithic, Technology, Iranamadu formation

1. Senior Lecturer, Department of Social Sciences and Comparative Studies, Sri Lanka Bhiksu University of Sri Lanka
   E-mail: sirisumangala80 gmail.com https://orcid.org/0009-0001-8618-3666
2. Prof. Department of History and Archaeology, University of Sri Jayawadanapura, Sri lanka.
   E-mail: alex@sjp.ac.lk
3. Senior Lecturer, Department of History and Archaeology, University of Sri Jayawadanapura, Sri lanka.
   E-mail: oshan@sjp.ac.lk

Received: 9 June 2025, Accepted revised version: 28 November 2025.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

හැඳින්වීම

උතුරු පළාතේ මන්නාරම් දිස්ත්‍රිකයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරඩක්කුලි ග්‍රාමසේවා වසමේ මෙම ගවේෂණ භූමිය පිහිටා ඇත. භූ විද්‍යාත්මක බෙදීම්වලට අනුව මෙම ප්‍රදේශය වන්නි සංකීර්ණයට (Wanni Complex) අයත් වේ (Cooray,1984). පැරණි පුත්තලම මන්නාරම මාර්ගයේ කල්ලාරු පාලම පසුකොට කිලෝමීටරයක් පමණ පුත්තලම දෙසට ගමන් කරන විට හුනේෂ් නගර් විද්‍යාලය හමුවේ. මෙම විද්‍යාලය ඉදිරිපිට වූ හුනේෂ් නගර් වෙරළ මාර්ගයේ කිලෝමීටරයක් ගමන් කළ විට මෙම විවෘත භූමිය වෙත පිවිසිය හැකි අතර හෙක්ටයාර් විසිපහක් පුරා විවෘත භූමිය ව්‍යාප්ත වී තිබේ. කල්ලාරුව පිටාර ගැලීම සහ අවට ප්‍රදේශයේ එක්රැස්වන ජලය මෙම භූ කළාපය හරහා මුහුදට ගලා යයි. දීර්ඝ කාලීනව මෙම ක්‍රියාවලිය සිදු වීමෙන් තද බවින් තොර සියලු මතුපිට පස්තට්ටුව සේදී යාමෙන් බොරලු සහිත භූ කළාපය නිර්මාණ වී තිබේ. වාර්ෂිකව සිදුවන මෙම පාරිසරික තත්ත්වය යටතේ භූමියේ ව්‍යාප්තවීමක් සිදුවන බව පැහැදිලි වේ (ඡායාරූප අංක 01). මධ්‍ය පුරාතන ශිලා යුගයේ දී ද මෙම විවෘත භූමිය පැවැති අතර ඒ ආශ්‍රිතව මානව ක්‍රියාකාරීත්වයක් පැවති බව මින් හමුවන ශිලා මෙවලම් ඇසුරින් තහවුරු වේ. මතුපිට පස් තට්ටුව සෝදාගෙන යාමෙන් බොරලු තට්ටුව මත පිහිටි ශිලා මෙවලම් විශාල වශයෙන් මතු වී තිබේ. මේවා ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සඳහා වූ ප්‍රධානත ම මූලාශ්‍රය වන්නේය.



සිතියම් 01 ගවේෂිත ප්‍රදේශය



ඡායා රූප 01 ගවේෂිත ප්‍රදේශය

සාහිත්‍යය විමර්ශනය

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ ඉතිහාසය දෙස බැලීමෙන් පෙනී යන්නේ මධ්‍ය ශිලා යුගය සම්බන්ධයෙන් වූ පර්යේෂණ බහුල වශයෙන් සිදුකොට ඇති බවයි (Deraniyagala, 1992, Wejepala, 1996, Perera, 2010, Wedage, 2024). මෙරට මධ්‍ය පුරාතන ශිලා යුගය පිළිබඳ වූ පර්යේෂණයන් හි දැඩි ඌණතාවයක් පවතියි. රජයේ ඛනිජ සම්පත් පිළිබඳ විශේෂඥයකු වූ ඊ.ජේ. වේලන්ඩ් විසින් වයඹ දිග කළාපයේ පවතින මෙම සුවිශේෂී භූ සැකැස්ම පිළිබඳව ප්‍රථම වතාවට වර්තා කළේය. මොහු මේවා සානු නිධි වශයෙන් හඳුන්වා ඇති අතර වර්තමානයේ බොරලු කන්ද නමින් හඳුන්වන මෝදරගම් ආරුව ආසන්නයේ වූ විවෘත භූමිය පරීක්ෂාකොට ඉන් මධ්‍ය පුරාතන ශිලා යුගයේ මෙවලම් හමුවන බව පළමු වරට වාර්තාකොට ඇත (Weland, 1914:166-175). මොහු විසින් වාර්තාකොට ඇති ශිලා මෙවලම්වල රූප විද්‍යාත්මක ලක්ෂණ අනුව ඒවා මධ්‍ය පුරාතන ශිලා යුගයට අයත් වේ. පී.ඊ.පී දැරණියගල විල්පත්තුව සහ රත්නපුර යන ප්‍රදේශයන්හි සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණවල දී ද පුරාතන ශිලා යුගයට අයත් මෙවලම් හමු වූ බව පවසයි (Deraniyagala, 1958:59-63). මෙම සුවිශේෂී පාංශු කලාපය පුත්තලම් ප්‍රදේශයේ සිට මුලතිව් දක්වාත් ගිනිකොණ දිග හම්බන්තොට ප්‍රදේශය ආශ්‍රිතව ද ව්‍යාප්ත වි පවතින බව පෙන්වා දී ඇති අතර සිරාන් දැරණියගල ඉරණ මඩු

පාංශු සැකැස්ම යනුවෙන් මෙම සුවිශේෂී භූ කලාපය නම්කොට තිබේ. විශේෂයෙන් බූන්දල, පතිරාජවෙල, මිනිහාගල්කන්ද යන ස්ථාන ආශ්‍රිතව පර්යේෂ සිදු කොට මධ්‍ය පුරාතන ශිලා යුගයට අයත් මෙවලම් හමුවන බව වාර්තා කොට ඇත (Deraniyagala, 1992). ඉරණමඩු පාංශු සැකැස්මට අයත් භූ කලාපයේ මතුපිට ගවේෂණවලින් හමු වූ ශිලා මෙවලම් පදනම්කොට ගෙන ශ්‍රී ලංකාවේ පුරා ශිලා යුගය පවතී ද යන්න පිළිබඳව සිරාන් දැරණියගල විසින් මූලික හැඳින්වීමක් සිදුකොට තිබේ (Deraniyagala, 1981 : 143-156). ඉරණමඩු පාංශු සැකැස්මට අයත්වන දකුණු වෙරළ තීරයේ පිහිටි පතිරාජවෙල බොරලු තැන්පතුව වසර 74000 පැරණි බව විද්‍යාත්මක පර්යේෂණ තුළින් (TL) තහවුරු කොට තිබේ (Singhvi et al.,1986:139-144). මේ ආශ්‍රිතව හමුවන ශිලා මෙවලම් නිර්මාණ තාක්‍ෂණය පිළිබඳ අවධානය යොමු කරමින් ඒවා වසර එක්ලක්‍ෂ විසිපන්දහසක් පමණ පැරණි විය හැකි බව දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala, 1992). පතිරාජවෙල ආශ්‍රිතව මොහාන් අබේරත්න සිදුකළ පර්යේෂණවලට අනුව වසර එක්ලක්ෂ පනස්දහසක (OSL) දින නියමයක් ඉදිරිපත් කොට තිබේ (Aberatna, 1996:101). මෙම දින නියමයන් ලබාගත් ස්ථරවලින් මානව කෘති හමු වූ බවක් සඳහන් කොට නොමැති අතර වසර 80000 ට අයත් පහළ ස්තරවලින් Smmal flake tool හමු වූ බව සඳහන් කොට ඇති අතර මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු කිසිවක් ඉදිරිපත්කොට නොමැත. 2024 වර්ෂයේ පතිරාජවෙල ආශ්‍රිතව සිදුකළ පර්යේෂණවලින් අදින් වසර විසිපන්දහස වන විටත් පතිරාජවෙල ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ බව OSL දින නියමයක් මගින් තහවුරු කරයි (Amano.et al, 2025 : 1-16). මෙම කරුණු අනුව පතිරාජවෙල ආශ්‍රිත ප්‍රාග් මානව ක්‍රියාකාරීත්වයේ උපරිමය වසර අසූදහසයැ යි සීතීම වඩා සඳුසු වේ. වයඹ දිග වෙරළ ආශ්‍රිත කළාපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයා පිළිබඳව පර්යේෂණ සිඳුව ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ජොන් කාස්වේල් සහ සිරාන් දැරණියගල යන පූරාවිද්‍යාඥයින්ගේ මූලිකත්වයෙන් මාතොට වරාය නගරයේ සිදු කළ පර්යේෂණ කැණීමෙන් මධ්‍යය ශිලා යුගයේ අවසාන කාලයට අයත්වන අදින් වසර 1800 පැරණි ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරීත්වයක් පැවති බවට තොරතුරු වාර්තාකොට තිබේ (Deraniyagala, 1992).

පර්යේෂණ අරමුණ

පහළ කල්ලාරු වම් නිම්නයේ පිහිටි එළිමහන් භූමිය ආශ්‍රිතව සිදු කළ පුරාවිද්‍යාත්මක ගවේෂණයෙන් හමු වූ ශිලා මෙවලම් වර්ගීකරණය කොට ඒ ආශ්‍රිතව පැවති ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන පර්යේෂණ අරමුණ වේ.

පර්යේෂණ ගැටලුව

පහළ කල්ලාරුව ආශ්‍රිතව හමු වන ශිලා මෙවලම් තුළින් කුමණ යුගයකට අයත් මානව ක්‍රියා කාරීත්වයක් නිරූපනය වන්නේ ද? යන්න සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

පර්යේෂණ ක්‍රමවේදය

ඉහත සඳහන් පර්යේෂණ ගැටලුව නිරාකරණය කර ගැනීම උදෙසා පහත දැක්වෙන පර්යේෂණ ක්‍රමවේද අනුග මනය කළේය. මෙම පර්යේෂණයට අදාළ පුරාවිද්‍යාත්මත දත්ත එක් රැස් කිරිම සඳහා ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය භාවිත කෙරිණි. මෙහි දී පුරාවිද්‍යා ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා අගලේ සිතියම් භාවිත කළ අතර හඳුනාගත් පුරාවිද්‍යා ක්ෂේත්‍රය මීටර් 5×5 ප්‍රමාණයේ කොටුවලට බෙදා ගනිමින් පුරාවස්තු වාර්තා කිරිම සිදු කරණ ලදී. පුරාවස්තු වාර්තා කිරීමේ දී එහි නිරපේක්ෂ පිහිටීම ලබාගැනීම සහ ඡායාරූප

ලබාගැනිම යන ක්‍රමවේදය අනුගමනය කළ අතර අවශ්‍ය අවස්ථාවල දී පුරාවිද්‍යාත්මක විධි නියමයන් යටතේ නියැදි ලබාගැණින. ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය යටතේ හඳුනාගත් නියැදි සංසන්දනාත්මකව විශ්ලේෂණය කළ යුතුය. එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමේ දී පූර්ව පර්යේෂණ පිළිබඳ දත්ත අධ්‍යයනය සඳහා පුස්තක ගවේෂණ ක්‍රමවේදය භාවිත කෙරිණි.

පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ වයඹ දිග ඉරණමඩු පාංශු සැකැස්මට අයත්වන සුවිශේෂි භූ කළාපය මෙරට මධ්‍ය පුරාතන ශිලා යුගයේ සිට ඓතිහාසික යුගය දක්වා වූ කාල පරාසයේ මානව ඉතිහායය පිළිබඳව අධ්‍යයනය කිරිමේ දී ඉතා වැදගත් නව පර්යේෂණ කළාපයකි. මධ්‍ය ශිලා යුගය, පූර්ව ඓතිහාසික යුගය සහ ඓතිහාසික යුගයන් නියෝජනය වන අයුරින් පර්යේෂණ යම් ප්‍රමාණයක් සිදු කොට ඇත. එහෙත් උක්ත ප්‍රදේශයේ මධ්‍යතන පුරා ශිලා යුගය පිළිබඳව පර්යේෂණ සිදුව ඇත්තේ ඉතාම අල්ප වශයෙනි. පුරාශිලා සාධක සහිත ස්ථාන බොහෝමයක් විවිධ සංවර්ධන කටයුතු නිසා මේ වනවිටත් විනාශ වී ගොස් ඇත. ශ්‍රී ලංකාවේ පුරා ශිලා යුගයට අයත් තොරතුරු බොහොමයක් ව්‍යාප්ත වී ඇත්තේ ඉරණමඩු පාංශු සැකැස්ම ආශ්‍රිතවය. එබැවින් මෙම පර්යේෂණයේ දී කල්ලාරුව සහ මොදරගම්ආරුව ආශ්‍රිත ප්‍රදේශයේ මධ්‍යතන පුරාශිලා යුගයේ පැවති මානව ක්‍රියාකාරීත්වය යම් ප්‍රමාණයකට අධ්‍යයනය කෙරේ. එබැවින් තත් යුගය පිළිබඳව පවතින පර්යේෂණ දැනුම සංවර්ධනය වීම යන කරුණු පදනම් කොටගෙන මෙම පර්යේෂණය බෙහෙවින් වැදගත් වේ.

සාකච්ඡාව

කල්ලාරුව ඔය වම් ඉවුරේ පිහිටි මීටර් 2-3 ප්‍රමාණයේ උසින් යුක්ත ගොඩැලි විශාල ප්‍රමාණයක් තත් භූමියේ ව්‍යාප්ත වී ඇත. මෙම භූ දර්ශනය සකස් වීම සඳහා අධික වර්ෂාව, සුළඟ සහ ජල ගැලීම යන පාරිසරික සාධක හේතු වී ඇති බව මූලික නිරීක්ෂණවලින් පැහැදිලි විය. ක්‍රමිකව මතුපිට පැවති පස් ස්ථර සෝදායාමෙන් බොරලු ස්ථරය මතු වී ඇත. එම බොරලු ස්තරය මත ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරිත්වයක් පැවති බව මින් හමු වූ ශිලා මෙවලම් ඇසුරින් පැහැදිලි වේ. මෙම භූමියට උතුරු පසින් කල්ලාරුව නම් ජල මූලාශ්‍රයත් බටහිර දෙසින් නොගැඹුරු මුහුදු තීරය සහ ප්‍රදේශයටම ආවේනික වූ වෘක්ෂලතාවන්ගෙන් සැදුම් ලත් වනාන්තර පිහිටා තිබේ. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික මානවයාට ජීවත් විම සඳහා වු සම්පත් බහුල ප්‍රදේශයක් වශයෙන් තත් ප්‍රදේශය හඳුනාගත හැකිය. මින් හමු වූ ශිලා මෙවලම් පිළිබඳ විශ්ලේෂණාත්මක තොරතුරු පහත වගුවේ දැක්වේ.

කල්ලාරු ප්‍රදේශයෙන් හමු වූ ශිලා මෙවලම් විශ්ලේෂණය සටහන

(වගු අංක 01)

Tool No	Location	Tool Type	Materiyal	Platform	Comments
01	8.63719N 79.99056E	අතුරු දිශාවන් සහිත න්‍යාස්ටියකි.	කහඳ	-	-
02	8.63618N 79.98047E	අසම්පූර්ණ න්‍යාෂ්ටියකි.	තිරුවානා	-	පතුරු ගලවා ගැනීම සඳහා යොදාගත් න්‍යෂ්ටියක් ලෙස හඳුනාගත හැකිය.
03	8.63620N 79.99346E	පතුරු මෙවලමකි.	කහඳ	-	බුබුල මෙන්ම පැහැදිළි රතු පැහැති කැපුම් දාර සහිත මෙවලමකි.
04	8.63621N 79.99050E	දෙපැති මෙවලමකි.	කිරිපැහැති තිරුවානා	සංකීර්ණ පාදමකින් යුක්ත වේ.	මෙවළමේ ඉහළ කොටස කැඩී ගොස් ඇත.

05	8.63619N 79.99046E	අසම්පූර්ණ න්‍යාෂ්ටියකි.	කහඳ	-	පතුරු ගලවා ගැනීම සඳහා යොදාගත් න්‍යෂ්ටියකි.
06	8.63795E 79.9492E	අසම්පූර්ණ න්‍යාෂ්ටියකි.	කහඳ	-	අසම්පූර්ණ න්‍යස්ටියක් සේ සැලකිය හැකිය.
07	8.63619N 79.99046E	අසම්පූර්ණ පතුරකි.	තිරුවානා	හඳුනාගත නොහැක.	බොහෝ දුරට පතුරු මෙවලමක් සේ සැලකිය හැකිය.
08	8.63828E 79.95051N	දෙපැති උල් මෙවලමකි.	තිරුවානා	සංකීර්ණ පාදමකින් යුක්ත වේ	දෙපැති කැපුම් දාර සහිතව නිර්මාණය කොට ඇත.
09	8.63812N 79.95069E	ලෙවාලුයානු පතුරු මෙවලමකි.	කහඳ	සමතල පාදමකි	ලෙවාලුවා වර්ගයට අයත් කැපුම් මෙවලමකි.
10	8.64028N 79.99169E	අසම්පූර්ණ පතුරකි.	කහඳ	-	අසම්පූර්ණ කැපුම් මෙවලමකි.
11	8.63746N 79.94976E	දෙපැති උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	ඉහළ කොටස කැඩී ගිය දෙපැති උල් මෙවලමකි.
12	8.63776N 79.94986E	හඳුනාගත නොහැකි ලෙවාලුවානු උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	ලෙවාලුවානු මෙවලමක් විය හැකිය. මෙහි ඉහළ කොටස කැඩී ගොස් ඇත.
13	8.63827N 79.95045E	අතුරු දිශාවන් සහිත පතුරකි.	කහඳ	සමතල පාදමකි.	ඉහළ කෙළවර කැඩී ගිය පතුරු මෙවලමකි.
14	8.63811N 79.99093E	එක් පැති උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	දෙපැති පැති කැපුම් දාර සහිත උල් මෙවලමකි.
15	8.63619E 79.95046E	විවිධ පැති සහිත උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	මෙවලමේ වම් පස කොටස කැඩී ගොස් තිබේ.
16	8.63827N 79.95067E	අතුරු දිශාවන් සහිත මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි	ඉහළ කෙළවර කැඩී ගොස් ඇත. දෙපැති

					මෙවලමක් විය හැකිය.
17	8.63786N 74.95024E	අතුරු දිශාවන් සහිත උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	මූලික හැඩගැන්වීම් සහිත සම්පූර්ණ මෙවළමකි.
18	8.63811N 79.95043E	එක් පැති පතුරු මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි	සීරුම් මෙවළමක් වශයෙන් භාවිත කළ හැකිය.
19	8.6244N 79.45048E	දෙපැති පතුරු මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	ඉහළ කෙළවර කැඩී ගිය දෙපැති මෙවළමකි.
20	8.63786N 79.95035E	දෙපැති පතුරු මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	සීරුම් මෙවළමකි.
21	8.63735N 79.94955E	අතුරු දිශාවන් සහිත පතුරකි.	කහඳ		ඉහළ කෙළවර කැඩී ගොස් ඇති අතර උල් මෙවලමක් සේ සැළකිය හැකිය.
22	8.63514N 79.94974E	විවිධ පැති සහිත මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	දෙපැති උල් කැපුම් ලක්‍ෂණ දැකිය හැකිය.
23	8.63611N 79.95093E	විවිධ පැති සහිත ලෙවාලුවානු උල් මෙවලමකි.	කහඳ	-	අසම්පූර්ණ ලෙවාලුවානු උල් මෙවලමකි.
24	8.63034N 79.95051E	විවිධ පැති සහිත පතුරු මෙවලමකි.	කහඳ	සමතල පාදමකි.	අසම්පූර්ණ මෙවළමකි. කුමන කර්යක් සඳහා භාවිත කලා ද යන්න අපැහැදිලිය.
25	8.63811N 79.95093E	එක් දිශාවකට පමණක් රැලි සහිත පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	ලෙවාලුවානු පතුරු මෙවළමකට සමාන වන අතර ඉහළ කෙළවර කැඩී ගොස් ඇත.
26	8.63812N 79.95069E	ත්‍රිකෝණාකාර උල් මෙවලමකි.	කහඳ	-	දෙපැති කැපුම් දාරයන්ගෙන් යුක්ත වේ.

27	8.63205N 79.99036E	එක් දිශාවකට පමණක් රැලි සහිත පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	අසම්පූර්ණ පතුරු මෙවලමකි.
28	8.63619N 79.950460E	එක් පැති උල් මෙවලමකි.	කහඳ	-	ඉහළ කොටස කැඩී ගොස් ඇත.
29	8.63806N 79.99027E	එක් දිශාවකට පමණක් රැලි සහිත පතුරකි.	කහඳ	-	අසම්පූර්ණ මෙවලමකි.
30	8.63834N 79.95051E	දෙපැති උල් මෙවලමකි.	කහඳ	සමතල පාදමකි.	මූලික හා බඳ හැඩ ගැන් වූ සම්පූර්ණ මෙවලමකි.
31	8.6380084N 79.9443772E	එක් දිශාවකට පමණක් රැලි සහිත පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	තියුණු කැපුම් දාර දෙකකින් යුක්ත වේ.
32	8.63887N 79.95242E	උල් පතුරකි.	කහඳ	සමතල පාදමකි.	මෙවලමේ ඉහළ කෙළවර කර කැඩී ගොස් ඇත.
33	8.63602N 79.95067E	තල මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	දෙපැති කැපුම් දාරයන් මොට වී ඇත. ඉහළ කෙලවර කැඩී ගොස් ඇත.
34	8.63834N 79.95051E	අතුරු දිශා සහිත මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	දෙපැති කැපුම් දාර වලින් යුක්ත වන අතර මෙවලමේ ඉහළ කොටස කැඩී ගොස් ඇත.
35	8.637075N 79.949526E	ද්විතීයික හැඩගැන්වීම් සහිත එක් දිශාවකට රැලි ඇති පතුරු මෙවළමකි.	කහඳ	සමතල පාදමකි	කැපුම් මෙවලමක් වශයෙන් හඳුනා ගත හැකිය. ද්විතීයික හැඩගැන්වීම් සිදුකොට තිබේ.
36	8.63811N 79.95093E	එක් දිශාවකට රැලි ඇති පතුරු මෙවළමකි.	කහඳ	සමතල පාදමකි.	දෙපැති කැපුම් දාරවලින් යුක්ත වන අතර මෙවලමේ ඉහළ කොටස කැඩී ගොස් ඇත.

37	8.63786N 79.95025E	එක් දිශාවකට රැලි ඇති පතුරු මෙවළමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	ඉහළ කොටස කැඩී ගිය සීරුම් මෙවලමක් වශයෙන් භාවිත කොට තිබේ.
38	8.63786N 79.95025E	එක් දිශාවකට රැලි ඇති පතුරු මෙවළමකි.	කහඳ	-	කැපුම් දාර සහිත සීරුම් මෙවලමකි.
39	8.6349N 79.4548E	අතුරු පැති සහිත පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි	අසම්පූර්ණ මෙවළමකි. එක් කැපුම් දාරයක් පමණක් හඳුනාගත හැකිය.
40	8.63811N 79.95093E	පෙබල් මෙවලමකි.	තිරුවානා	-	පෙබල් මෙවලමක් ලෙස භාවිත කර ඇති බවක් පෙනේ.
41		පෙබලු මෙවලමකි.	තිරුවානා	-	පෙබල් මෙවලමක් වශයෙන් භාවිත කළ හැකිය.
42	8.63851N 79.95172E	එක් දිශාවකට රැලි ඇති පතුරු මෙවළමකි.	තිරුවානා	Croticle p.F	අසම්පූර්ණ මෙවලමක් වන අතර සීරුම් මෙවලමක් වශයෙන් භාවිත කළ හැකිය.
43	8.635733N 79.948178	අතුරු පැති සහිත පතුරකි.	කහඳ	සමතල පාදමකි.	අසම්පූර්ණ මෙවලමක් වන අතර කැපුම් තල කිහිපයක් පවතී.
44	8.635733N 79.948178E	ද්වීතීයික හැඩ ගැන්වූ පතුරකි.	කහඳ	-	සියුම් කැපුම් දාර සහිත මෙවලමකි.
45	8.59332N 79.920416E	ලෙවාලුවානු පතුරු මෙවළමකි.	කහඳ	සමතල පාදමකි.	ඉහළ කොටස කැඩීගිය අසම්පූර්ණ මෙවලමකි.
46	8.637315N 79.948971E	විවිධ දිශා සහිත උල් මෙවලමකි.	කහඳ	සමතල පාදමකි.	මූලික හැඩ ගැන්වීම් පමණක් දක්නට ලැබේ.

47	8.637317N 79.958981E	අසම්පූර්ණ පතුරු මෙවලමකි. එක් දිශාවකට පමණක් රැලි ඇත.	කහඳ	සමතල පාදමකි	අසම්පූර්ණ මෙවලමකි. බුබුල පැහැදිලිව දැකගත හැකිය.
48	8.647316N 79.958871E	අසම්පූර්ණ න්‍යෂ්ටියකි.	කහඳ	-	අසම්පූර්ණ න්‍යෂ්ටියකි.
49	8.637315N 79.948971	එක්පැති උල් මෙවලමකි.	තිරුවානා	සංකීර්ණ පාදමකි.	මූලික වටයේ හැඩ ගැන් වූ උල් මෙවලමකි.
50	8.637315N 79.943971E	එක් දිශාවකට රැලි සහිත පතුරකි.	කහඳ	සමතල පාදමකි.	එක් කැපුම් දාරයක් සහිත පතුරු මෙවලමකි.
51	8.635236N 79.947533E	අසම්පූර්ණ න්‍යෂ්ටියකි.	කහඳ	-	න්‍යෂ්ටියක කොටසකි
52	8.635944N 79.948126E	ලෙවාලුවානු න්‍යෂ්ටියකි.	කහඳ	සංකීර්ණ පාදමකි	පතුරු මෙවලමකි. පැති සූරන මෙවලමක් සේ සැළකිය හැකිය.
53	8.63811N 79.95093E	දෙපැති උල් මෙවලමකි.	කහඳ	Orotial string	ඉහළ කොටස කැඩී ගිය මෙවලමකි. මූලික මට්ටමේ හැඩගැන්වීම් දැකිය හැකිය.
54	,,	නැවත හැඩ ගසන ලද එක් පැති උල් මෙවලමකි.	කහඳ	සමතල පාදමකි.	දෙපස මූලික මට්ටමේ හැඩ ගැන් වූ මෙවලමකි. කැපුම් දාර ද්විතීය වශයෙන් හැඩ ගන්වා ඇත.
55	8.63811N 79.95093E	දෙපැති උත්තල පැති සීරුම් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	න්‍යෂ්ටියකි. මෙහි ලෙවාලුවානු සම්ප්‍රදායට අනුව පතුරු ඉවත් කොට ඇත.
56	8.84111N 79.95025E	අතුරු පැති සහිත න්‍යෂ්ටියකි.	කහඳ	-	පතුරු ඉවත් කිරීමට යොදාගත් න්‍යෂ්ටියකි.

57	8.6344N 79.95025E	පෙැති මෙවලමකි.	කහඳ	සමතල පාදමකි	ඉහළ කොටස කැඩී ගිය දෙපැති කැපුම් මෙවලමකි.
58	8.63811N 79.950093E	ලෙවාලුවානු පතුරු මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි	ලෙවාලුවානු සම්ප්‍රදායට අයත් පතුරු මෙවළමකි. විද්‍යමාන කාර්ය අපැහැදිලිය.
59	8.63811N 79.950093E	එක් දිශාවකට රැලි සහිත පතුරකි.	කහඳ	Orotial string	අසම්පූර්ණ පතුරු මෙවළමකි.
60	8.63811N 79.95093E	අසම්පූර්ණ පතුරු මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	අසම්පූර්ණ පතුරු මෙවලමකි. උත්තල සූරන මෙවළමක් විය හැකිය.
61	8.63746N 79.94976E	පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි	අසම්පූර්ණ මෙවළමකි. ප්‍රහාර වේදිකාව දැකගත හැකිය.
62	8.635603N 79.947833E	ලෙවාලුවානු න්‍යෂ්ටියකි.	කහඳ	සංකීර්ණ පාදමකි	ලෙවාලුවානු තාක්‍ෂණය යටතේ පතුරු ගලවා ඉවත් කළ මෙවළමකි.
63	8.635236N 79.947533E	අතුරු පැති සහිත න්‍යෂ්ටියකි.	කහඳ	-	පැහැදිළි ලෙස පතුරු ගලවා ගැනීමට භාවිත කළ සළකුණු සහිත න්‍යෂ්ටියකි.
64	8.63619N 79.9504E	අසම්පූර්ණ පතුරු මෙවලමකි.	කහඳ	-	භාවිත කාර්ය අපැහැදිලිය.
65	8.637479N 79.949071E	එක් දිශාවකට රැලි සහිත න්‍යෂ්ටියකි.	කහඳ	-	පතුරු ගළවා ගැනීම සඳහා භාවිත කළ න්‍යෂ්ටියකි.
66	8.633986N 79.948302E	එක් දිශාවකට රැලි සහිත පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	මූලික වශයෙන් හැඩ ගැන් වූ මෙවලමකි.
67	8.633977N 79.948308E	එක් දිශාවකට රැලි සහිත පතුරකි.	තිරුවානා	Crotial string	අසම්පූර්ණ මෙවළමකි. අර්ධ වශයෙන් හැඩගන්වා ඇත.

68	8.634525N 79.948212E	එක් දිශාවකට රැලි ඇති පතුරකි.	තිරුවානා	-	භාවිතයට ගන්නා ලද න්‍යෂ්ටියකි.
69	8.634535N 79.948202E	ද්විතීයික වශයෙන් හැඩ ගැන්වූ එක් දිශාවකට රැලි ඇති පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	අසම්පූර්ණ මෙවළමක් වුව ද ද්විතීයික වශයෙන් හැඩ ගසා ඇත.
70	8.634535N 79.948202E	එක් දිශාවකට රැලි ඇති පතුරකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	මූලික හැඩ ගැන් වූ මෙවලමකි.
71	8.634535N 79.948202E	විවිධ පැති සහිත න්‍යෂ්ටියකි.	කහඳ	-	පතුරු ගලවා ගැනීමේ දී ඉවත් කළ න්‍යෂ්ටියකි.
72	8.634535N 79.920416E	අසම්පූර්ණ න්‍යෂ්ටියකි.	කහඳ	-	පතුරු ගලවා ගැනීමේ දී මූලික වශයෙන් ඉවත් කළ න්‍යෂ්ටියකි.
73	8.638775N 79.351678E	විවිධ පැති සහිත කුඩා ලෙවාලුවානු සම්ප්‍රදායට අයත් පතුරකි.	කහඳ	Flat sta rig P.F	භාවිත කරණ ලද සළකුණු සහිත මෙවළමකි.
74	8.637663 N 79.99980 E	අසම්පූර්ණ පතුරකි.	කහඳ	-	පතුරු ගලවා ගැනීමේ දී ඉවත දැමූ මෙවලමකි.
75	8.63605N 79.95031E	සූරන මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි	මධ්‍යම ප්‍රමාණයේ සූරන මෙවලමක් ලෙස සැළකිය හැකිය.
76	8.63537N 79.94996E	එක් දිශාවකට රැලි සහිත පතුරකි.	තිරුවානා	Crotial stng	භාවිත කරන ලද සළකුණු සහිත මධ්‍යම ප්‍රමාණයේ සළකුණු සහිත මෙවලමකි.
77	8.63746N 79.94976E	දෙපැති උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි.	මුස්ටේරියානු සම්ප්‍රදායට තරමක් සමාන උල් මෙවලමකි.
78	8.63746N 79.94996E	කැපුම් දාර දෙකක් සහිත නැවත හැඩ	කහඳ	සංකීර්ණ පාදමකි.	ද්විතීයික වශයෙන් හැඩ ගැන් වූ

		ගැන්වූ උල් මෙවලමකි.			කැපුම් දාරයකින් යුක්ත වේ.
79	8.63774N 79.94996E	අතුරු පැති සහිත පතුරකි.	කහඳ	Crotial strng P.E	මූලික වශයෙන් හැඩ ගැසූ කැපුම් මෙවලමක් විය හැකිය.
80	8.63774N 79.94935E	අතුරු පැති සහිත පතුරකි.	කහඳ	සමතල	ඉහළ කොටස කැඩී ගිය දෙපැති තැලුම් මෙවළමකි.
81		ලෙවාලුවානු තැලුම් මෙවලමකි.	කහඳ	-	ඉහළ කෙළෙවර කැඩී ගිය ලෙවාලුවානු වර්ගයේ මෙවලමකි.
82	8.637017N 79948711E	අසම්පූර්ණ න්‍යෂ්ටියකි.	කහඳ	-	පතුරු ගලවා ඉවත් කරණ ලද සළකුණු සහිත න්‍යෂ්ටියකි.
83	8.63981N 79.95205E	පතුරු මෙවලමකි.	තිරුවානා	-	කැපුම් දාර දෙකකින් යුක්ත වේ. ද්විතීයික හැඩ ගැන්වීම තරමක් ඉස්මතු වේ.
84	8.63629N 79.25024E	විවිධ පැති සහිත න්‍යෂ්ටියකි.	කහඳ	-	විවිධ පැති සහිත න්‍යෂ්ටියකි.
85	8.63619N 79.25004E	ධාරිත ජල ගලකි.	තිරුවානා	-	න්‍යෂ්ටියකට පහර දීම සඳහා යොදාගත් මිටියක් ලෙස සැළකිය හැකිය. භාවිත සලකුණු සහිතය.
86	8.63626N 79.25114E	විවිධ පැති සහිත න්‍යෂ්ටියකි.	කහඳ	-	තල මෙවලම් සැකසීම සඳහා පතුරු ගලවාගත් සලකුණු සහිත තල න්‍යෂ්ටියක් වශයෙන් හඳුනාගත හැකිය.
87	8.62621N 79.25224E	අසම්පූර්ණ දෙපැති උල් මෙවලමකි.	කහඳ	සංකීර්ණ පාදමකි	ඉහළ කෙළවර කැඩී ගිය තුඩ ගැන්වූ මෙවලමකි.

NO. 90



NO. 38



NO. 25



NO . 21



NO . 17



NO . 39

සැලසුම් අංක 01

විශ්ලේෂණය සඳහා යොදාගත් ශිලා මෙවලම් අතුරින් කිහිපයක්

විවෘත භූමියේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා ශිලා මෙවලම් නිර්මාණය කිරිම සඳහා කහඳ සහ තිරුවාණා යන ප්‍රධාන පාෂාණ වර්ග දෙක භාවිත කොට ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක හමු වේ. එම මානවයා බහුල වශයෙන් මෙවලම් නිර්මාණය කිරීම සඳහා කහඳ පාෂාණය භාවිත කොට ඇත. සමස්තයක් වශයෙන් ගත් විට වෙරළබඩ කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයින් මෙවලම් නිර්මාණය කිරීම සඳහා කහඳ පාෂාණය බහුල වශයෙන් භාවිත කොට ඇති බව පැහැදිලි වේ. එහෙත් මේ සඳහා අවශ්‍යය මූලික අමුද්‍රව්‍ය කුමන ප්‍රදේශයකින් ලබාගත්තා ද යන්න තහවුරු කිරීමට තරම් ප්‍රමාණවත් සාධක ගවේෂණයේ දී හඳුනා ගැනීමට නොහැකි විය. ඇතැම් විට මේ සඳහා අවශ්‍ය පාෂාණ ගංගා ආශ්‍රයෙන් සොයාගන්නට ඇතයි සිතීය හැකිය. තිරුවාණා පාෂාණය ගංගා ආශ්‍රිතව මෙන් ම විවෘත භූමිවල බහුල වශයෙන් දැකිය හැකිය. මෙවා ආශ්‍රිතව ගලා බස්නා තාවකාලික ජල මාර්ගය කරණ කොටගෙන විවිධ ප්‍රමාණයේ බෝල ගල් මතු වී ඇති අයුරු නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික මානවයා අවශ්‍ය අවස්ථාවන්වල දී මෙවලම් නිර්මාණය කිරීම සඳහා මේවා භාවිත කරන්නට ඇත. මෙම පාෂාණ වර්ගය ලබා ගැනීම එතරම් අපහසු කටයුත්තක් නොවුන ද තිරුවාණා ශිලා මෙවලම් හමු වූයේ ඉතා සුළු වශයෙනි. කහඳ පාෂාණ මෙවලම් සවි ශක්තිමත් භාවය සහ තියුණු බව යන ගුණාංග සෙසු පාෂාණ සාපේක්ෂව ඉහළ අගයකින් යුක්ත වන නිසා කහඳ පාෂාණමය මෙවලම්වලට මොවුන් වැඩි කැමැත්තක් දක්වන්නට ඇතයි සිතීම වඩාත් යුක්ති සහගත වේ.

අනු අංකය	පාෂාණ වර්ගය	මෙවලම් ප්‍රමාණය
01	කහඳ	74
02	කිරි පැහැති තිරුවාණා	01
03	තිරුවාණා	12

ශිලා මෙවලම් නිෂ්පාදිත පාෂාණ වර්ග (වගු අංක 02)

තාක්ෂණික පන්තීන් අනුව ශිලා මෙවලම් වර්ගීකරණය

කල්ලාරු ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ කැණීම් භූමිය අවට හෙක්ටයාර් විසි පහක එළිමහන් භූමිය පුරා සිදු කළ පුරාවිද්‍යා ගවේෂණයේ දී හඳුනාගත් ශිලා මෙවලම් විවිධ තාක්ෂණික පන්තීන්වලට අයත්වන බව මූලික විමර්ශනයේ දී පැහැදිලි විය. ඒවායේ ඇති රූප විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී තාක්ෂණික පන්තින් විස්සකට (20) අයත් වන මෙවමලම් හඳුනාගැනීමට හැකි විය. ඒ පිළිඳව සවිස්තරාත්මක තොරතුරු පහත වගුවේ දැක්වේ.

අනු අංකය	ශිලා මෙවලම් වර්ගය	ප්‍රමාණය	ප්‍රතිශතය %
01	න්‍යෂ්ටි Core	02	2.2
02	ලෙවාලුයානු න්‍යෂ්ටීන් Levallois Core	02	2.2
03	ප්‍රහාර වේදිකා සහිත න්‍යෂ්ටීන් Maltiplatform Core	02	2.2
04	අසම්පූර්ණ න්‍යෂ්ටීන් Core Fragmeant	08	9.09
05	දෙපැති න්‍යෂ්ටීන් Bidiretional Core	03	3.4
06	දෙපැති මෙවලම් Biface	02	2.2
07	ලෙවාලුයානු පතුරු මෙවලම් Levallois Flake	04	4.5
08	පතුරු මෙවලම් Flake	06	6.8
09	පතුරු කැබලි Flake Piece	05	5.6
10	ද්විතීක හැඩ ගැන්වූ බිඳීගිය පතුරු Broken retoach Flake	01	1.1
11	ලෙවාලුයානු උල් මෙවලම් Levallois point	02	2.2
12	උල් මෙවලම් Point	03	3.4
13	දෙපැති උල් මෙවලම් Biface Point	09	10.2
14	විවිධ පැති සහිත උල් මෙවලම් Unifaceal Point	02	2.2
15	අතුරු දිශාවන් සහිත පතුරු මෙවලම් Bidiretional Flake	07	7.9
16	එක් දිශාවකට විහිදී ගිය රැලි සහිත පතුරු මෙවලම් Radial Flake	13	14.7
17	තල මෙවලම් Blade	01	1.1
18	නැවත හැඩ ගැන්වූ පතුරු මෙවලම් Retouch Flake	04	4.5
19	පෙබල් මෙවලම් pebble	03	3.4
20	පැති සූරන මෙවලම් Side Scraper	02	2.2

(වගු අංක 03)

(වගු අංක 03)

විවිධ තාක්‍ෂණික පන්තිවලට අයත් ශිලා මෙවලම්

ගවේෂණයේ දී හඳුනාගත් ශිලා මෙවලම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉහත දක්වා තිබේ. මෙම භූමිය භූවිද්‍යාත්මක විග්‍රහයට අනුව ඉරණමඩු පාංශු සැකැස්මට අයත් වේ (Deraniyagala, 1992). ශිලා මෙවලම් බොහෝ ප්‍රමාණයක් බොරලු තට්ටුව මත තැන්පත් වූ ඒවා වශයෙන් හඳුනාගත හැකිය. ගවේෂණයේ දී එක් රැස් කළ නියැදි ප්‍රමාණය එකසිය පනහකට අධික වේ. මේ අතුරින් ශිලා මෙවලම් අසූ අටක ප්‍රමාණයක් මෙම විශ්ලේෂණය සඳහා භාවිත කරණ ලදි. ශිලා මෙවලම් විශ්ලේෂණය කිරීමේ දී මූලික වශයෙන් ඒවායේ රූප විද්‍යාත්මක ලක්‍ෂණ කෙරේ අවධානය යොමු කළ අතර දකුණු ආසියානු කලාපයේ ශිලා මෙවලම් විග්‍රහ කිරීමේ දී යොදාගන්නා ලද ක්‍රමවේද කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළ හැකිය. මෙවලම් පිළිබඳ අර්ථකථනය කිරීමේ දී දකුණු ඉන්දියාවේ ප්‍රධාන ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථාන දෙකක් ලෙස සැලකෙන ජ්වලපුරම් සහ අක්කිරම්පක්කම් ශිලා මෙවලම් නිර්මාණය කිරීම සඳහා බහුල වශයෙන් භාවිත කොට ඇත්තේ කහඳ පාෂාණය යි. කල්ලාරුව ආශ්‍රිතව සිදු කළ පුරාවිද්‍යාත්මක ගවේෂණයෙන් හමු වූ ශිලා මෙවලම් එකතුව අතර වැඩි ප්‍රමාණයක් ඇත්තේ කහඳ පාෂාණමය මෙවලම්ය. මේවා නිර්මාණය කිරීම සඳහා වූ මූලික අමුද්‍රව්‍යය කල්ලාරු නිම්නයෙන් ම සොයාගෙන තිබේ. විශේෂයෙන් ජල මූලාශ්‍රය ආශ්‍රිතව ශිලා මෙවලම් නිර්මාණය කිරීම සඳහා සුදුසු කිරිපැහැති සහ පැහැදිලි තිරුවාණාමය බෝල ගල් බහුලව දක්නට ලැබේ. සමස්ත මෙවලම් ගොනුවෙන් 10% පමණ ප්‍රමාණයක් දෙපැති කැපුම් මෙවලම් සහ උල් මෙවලම්වලට අයත් වේ. මේවා මධ්‍ය පුරාතන ශිලා යුගයේ මුස්ටේරියානු උල් මෙවලම් හා සමීප වන බවක් පෙන්නුම් කෙරේ. පතුරු මෙවලම් අතර ලෙවාලුවානු සම්ප්‍රදාය නියෝජනය වන මෙවලම් කිහිපයක් ද වාර්තා වේ. එය 4% ප්‍රමාණයක් වේ. ලෙවාලුවානු පතුරු ගලවා ගැනීම සඳහා භාවිත කළ න්‍යෂ්ටීන් ද මේ අතර වේ. ලෙවාලුවානු සම්ප්‍රදාය ද මධ්‍ය පුරාතන ශිලා යුගයේ සුලභව වාර්තා වන මෙවලම් සම්ප්‍රදායක් වේ.

මෙවලම් තැනීම සඳහා යොදාගත් න්‍යෂ්ටීන් අතර සැළකිය යුතු විවිධත්වයක් දැකිය හැකි අතර ඉන් බහුතරයක් ඒවා විවිධ පැති සහිත න්‍යෂ්ටීන් වේ. මධ්‍ය පුරාතන ශිලා යුගයේ භාවිත වූ මධ්‍යම ප්‍රමාණයේ පතුරු මෙවලම් ඉහළ අගයක් වේ. ඒ අනුව එක් අතකට කැඩීගිය පතුරු 14% ද දෙපැති පතුරු මෙවළම් 7% ප්‍රමාණයකින් යුක්ත වේ. ද්විතීයික වශයෙන් හැඩ ගැන් වූ මෙවළම් සමස්ත ගොනුවේ දුර්ලභ වන අතර එය ශ්‍රී ලාංකීය මධ්‍ය ශිලා යුගයේ මෙවලම්වල කැපී පෙනෙන ලක්‍ෂණයකි. කල්ලාරු ශිලා මෙවලම් එකතුවේ කැපී පෙනෙන මෙවලම් ලෙස ලෙවාලුයානු සම්ප්‍රදායේ මෙවලම් සහ දෙපැති මෙවලම් පෙන්වාදිය හැකිය. මධ්‍ය පුරාතන ශිලා යුගයේ පැවතීම තහවුරු කෙරෙන ප්‍රධානතම සාධකයක් ලෙස ඉහත මෙවලම් සම්ප්‍රදාය පෙන්වාදිය හැකි අතර අක්කිරම්පක්කම් ශිලා මෙවලම් සමග කල්ලාරු ශිලා මෙවලම් රූප විද්‍යාත්මකව සැසඳීමෙන් පෙනීයන්නේ මෙරට වයඹ දිග වෙරළ ආශ්‍රිත කලාපයේ මධ්‍ය පුරාතන ශිලා යුගයේ මානව ක්‍රියාකාරීත්වයක් පැවති බවයි.

සමාලෝචනය

කල්ලාරුව ආශ්‍රිතව සිදුකරණ ලද පුරාවිද්‍යාත්මක ගවේෂණයේ දී හඳුනාගත් ශිලා මෙවලම්වලින් අනාවරණය වන ප්‍රධාන කරුණක් වන්නේ මෙම කලාපය කේන්ද්‍ර කරගනිමින් පැහැදිලි ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරකම් සිදු වී ඇති බවයි. ප්ලයිස්ටෝසීන මධ්‍ය හෝ අවසාන භාගයේ දී ඇති වූ ග්ලැසියර් කාල පරිච්ඡේදන්හි දී වෙරළ ආශ්‍රිත පැවති භූමියක් ලෙස

මෙය පවතින්නට ඇතැයි සැළකිය හැකිය. මන්දයත් ග්ලැසියර අවස්ථාවන්හි දී මානව සංචරණ කටයුතු සඳහා හිතකර පාරිසරික තත්ත්වයක් ලෝකයේ නිර්මාණය වී පැවති බවකි. ඉන්දියානු අර්ධද්වීපය හරහා මානව සංචරණ කටයුතු සිදු වන්නේ මෙම ග්ලැසියර් අවස්ථාවන්වලදී ය. කල්ලාරු ආශ්‍රිත ගවේෂණයෙන් හඳුනාගත් ප්‍රමුඛත ම මානව කෘති වන්නේ ශිලා මෙවලම්ය. කිසියම් ප්‍රාග් ඓතිහාසික තාක්ෂණික අවධිය හා එහි ජීවන රටාව යළි ගොඩනැගීම සඳහා වූ දායකත්වය ලැබෙනුයේ ශිලා මෙවලම්වලිනි. විශ්ලේෂණය කරණු ලැබූ සමස්ථ ශිලා මෙවලම් එකතුව පරීක්‍ෂා කිරීමෙන් පැහැදිලි වන කරුණක් වන්නේ මධ්‍ය පුරාතන ශිලා යුගයේ පැවැත්ම තහවුරු වන බවය. සමස්ථ ශිලා මෙවලම් එකතුවෙන් බහුතරය ලෙවාලුවානු තාක්ෂණික සම්ප්‍රදායට අයත් වේ. ඇතැම් ශිලා මෙවලම් මුස්ටීරියානු ශිලා ආයුධ නිපදවීමේ සම්ප්‍රදායට සබඳකම් දක්වයි. ඉහත තාක්ෂණික සම්ප්‍රදායයන් ද්විත්යම මධ්‍ය පුරාතන ශිලා යුගයේ මානව තාක්ෂණය හා බැදී පවතී යි. මෙම ශිලා මෙවලම් කුමන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රියාත්මක වූයේ ද යන්න මැන බැලීම සඳහා වූ ප්‍රධානත ම ප්‍රවේෂය වන්නේ ඉන්දියානු අර්ධද්වීපයේ මීට සමාන පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කිරීමය. ඉන්දියානු අර්ධද්වීපයේ මධ්‍ය පුරාතන ශිලා යුගය නියෝජනය වන ප්‍රමුඛ පෙලේ පර්යේෂණ ස්ථාන අතුරින් ජුවලපුරම් සහ අක්තිරම්පට්ටම් යන ස්ථාන ඉතා වැදගත් වේ (Ptraglia, et al 2007, Papu, et al 2003). ඉහත පර්යේෂණ ප්‍රතිඵලයන්ට අනුව ඉන්දියානු මධ්‍ය පුරා ශිලා යුගයේ පැවැත්ම මීට වසර 80,000 ක සීමාවේ සිට 50,000 දක්වා වූ කාල සීමාව දක්වා දෝලනය වේ. එමෙන් ම උක්ත ස්ථාන ආශ්‍රිත පර්යේෂණ තුළින් හමු වූ ශිලා මෙවලම් කල්ලාරුව ආශ්‍රිතව හමු වූ ශිලා මෙවලම්වල රූප විද්‍යාත්මක ලක්‍ෂණ අනුව මෙන් ම තාක්‍ෂණික ගති ලක්‍ෂණ සමග සසදා බැලීමේ දී සමානකම් දක්නට ලැබේ. මෙරට මධ්‍ය පුරාතන ශිලා යුගයේ පැවැත් ම තහවුරුවන කලාපයක් ලෙස කල්ලාරුව අවට ප්‍රදේශය හඳුනාගත හැකි අතර ඉදිරි පර්යේෂණ තුළින් එය වඩ වඩාත් තහවුරු කළ යුතුය

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Aberatna, M. (1996). *Multi-Dating Studies of Archaeological Sites.* Unpublished Ph.D thesis. Canberra: The Australian National University.

Amano.et al, (2025). Early Sri Lankan coastal site tracks technological change and estuarine resource exploitation over the last ca. 25,000 years, *Scientific Reports 1-16*

Cooray, P.G. (1984). *An introduction to the geology of Sri Lanka (Ceylon).* National Museum of Sri Lanka.

Deraniyagala, P.E.P. (1958). *The Plesistocene of Ceylon,* Sri Lanka Natioal Museums, Colombo.

Deraniyagala, S.U. (1981). Was There A Palaeolithic (old stone age) in Lanka? Prehistoric excavation at Bundala and at Embilipitiya. *Ancient Ceylon,* No 4, 143-156.

Deraniyagala, S. U. (1992). *The Prehistory of Sri Lanka: and Ecological Perspective.* Memoir 8, 2nd ed. Archaeological Department, Colombo.

Pappu, S., Gunnell, Y., Taieb, M., Brugal, J.P., and Touchard, Y., (2003). Excavations at the Palaeolithic site of Attirampakkam, South India: Preliminary findings. *Current Anthropology* 44(4):591.

Petraglia, M., R. Korisetar, N. Boivin et al., (2007). Middle Paleolithic assemblages from the Indian subcontinent before and ater the Toba super-eruption. *Science* 317, 114–16.

Perera, H. N. (2010**).** *Prehistoric Sri Lanka, late Pleistocene Rock Shelters and an Open air site.* BAR International Series.

Singhvi, A., Deraniyagala, S. & Sengupta, D. Thermoluminescence dating of Quaternary red-sand beds: A case study of coastal dunes in Sri Lanka. (1986). *Earth Planetary Sci*. Lett. 80, 139–144.

Wedage. O, N. Amano, M. C. Langley, K. Douka, J. Blinkhorn, A. Crowther, S. Deraniyagala, N. Kourampas, I. Simpson, N. Perera, A. Picin, N. Boivin, M. Petraglia, P. Roberts, (2019), Specialized rainforest hunting by Homo sapiens ~45,000 years ago. *Nat. Commun*. 10, 1-8

Weland, E.J. (1915). Notes concerning the occurrence of smoll desert tracts in the northwest of Ceylon**.** *Spolia Zeylanica* 10 (37):166-174.

Wijayapala, W.H. (1997). *New Light on the Prehistory of Sri Lanka in the Context of recent excavations at cave sites.* Unpublished Ph.D thesis. University of Peradeniya.